පහන් වැට තුළට විත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්



# -වියත් පන්හිඳ-

අපට ඉඳහිට වියත් කවියන් හමුවෙයි. ඔවුන් ලොව දකින හැටි අපූරුය... සොඳුරුය... පසුගිය දිනෙක සුනිල් සරත් පෙරේරා නම් වූ කලාකරුවා ඔස්ට්‍රේලියාවට පැමිණියේය. ඔහු දුටු අසිරි කවියට නැගූ හැටි මේ බලන්න..

**මෙල්බන්**

හිමිදිරි උදේ අරුණළු පොකුරේ පිපෙන
දුටුවෙමි ගුවන් ගැබ හිඳ පුරවර දසුන
ගිම්හානයේ දවසක ගහ කොළ හෙළන
පා යුග තැබූවෙමු මෙල්බන් පුර දෙරන

**ඩැන්ඩිනොන්ග්**

ඩැන්ඩිනොන්ග් සන වනගත කඳුකරය
කුරුළු පාරාදීසය සුමියුරු සරය
ආදිම මිනිස් වාසය දියදම් වරය
කැටයම කලා සිතුවම රුව මනහරය

ඉදිරියට ☞ ☞

සුනිල් සරත් පෙරේරා

## උදා නොවූ බක්මහ

කොවුල් හඬ...
තෙත බරිත පරිසරය
විචිරි චිරි පොද වැස්ස
හරිත පැහැ ගහකොළ
සිනහ පිරි මුහුණු
සියළු දෑ අහිමි කළ
බක්මහ..

නෑසියන් පිරිවරා..
කැවුම් කිරිබත් කා..
සියල් සිරිත් සපුරා
ගෙවන අවුරුද්ද
අහිමි කළ බක්මහ..
ගත කළෙමි දුරු රටක
නොනගතය සේ....

**සී. කරුණාරත්න**

ඊයෙ අමතක කරන්න..
අද වැඩෙහි යෙදෙන්න..
හෙටට සැලසුම් කරන්න..

-Herbert N. Casson-

## වෙසක් මහේ සඳක් වගේ ඔබ සිත බැබළුණාවේ!!!

## බුදු කැකුළු

අගය
මෙ-මලේ
ඉහළ
මෙ-තරම්
පිපි නිසා
නොවෙදෝ...

නගමි
ඒ-තැනට
නැඟෙන
අදිටන
උතුම් දින
මෙ-පොහෝ...

**ජයත් පියදසුන්**

-පහන් පා-
පැදි එකතුව
මුද්‍රණයේ



ඔබ සැමට
සම්බුදු සරණයි!

සන්නස පහන් වැටෙහි අරමුණ කවියට, කලාවට ලැදි පරපුරක් බිහි කිරීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමයි. උපරිමයෙන් කවි පිටුව පුරවන්නේ ද මෙනිසාය. තතනමින් පද එකතු කර, කවියක් සේ තම සිතැඟි ඉදිරිපත් කරන කවරෙකුට වුවද සන්නසෙහි ඉඩ සැදෙනුයේ ඔහු මතු දිනයෙක දක්ෂ, යහපත් කවියෙකු වනු දැකීම උදෙසාය. පහන් වැට ඔබගේම වන්නේ ද එනිසාය.

ඔබේ නිර්මාණ මෙම ලිපිනයට එවන්න.
Sannasa Pahan Weta
61 Nattle Drive
Hallam Vic 3803
Australia
**Email:**
sannasanews@gmail.com

## ලස්සන මාළු

සමනළ වර්ණ
ගල්මල් අතරේ
රිද්මයකට සීරුවට
පීනා යන
ලොකු පොඩි මාළු රැන්
සුපැහැදිලි දියේ

රිදී තිරේ පුංචි තිරේ
දකින අපට සිතේ
අනේ කෙතරම්
සැහැල්ලුවක්ද ගැඹුරේ
නිදහසක් පාරාදීසයේ

ඒත්....?
කොයි මොහොතෙද අනතුර
වමෙන්ද දකුණෙන්ද
උඩින්ද යටින්ද..?
අප සැප පහසු අසුනක
දිගා වී ටී.වී එක බලමින්
හිතේ සතුටින්

**නිහාල් රූපසිංහ**

Ispired by
Ted Hughes' poem
'Flounder'- Collected poems for children

## ජීවිතය මගේ ඔබ

පාළුව තනිකම රජයන මොහොතක
සුන්දර සිතුවිලි දඟ කරනා
සොඳුරු අතීතයේ සිතුවම් එකිනෙක
සිහි වී හදවත කිති කවනා
හිරු මිලින වූ සැඳෑවේ
සයුර රළ මායිමේ
උණුසුමට තුරුල් වී
පිය නැගුව පෙර දිනේ
සිත් ඉවුර ඉකිබිඳින
සඳ එබෙන ගනඳුරේ
ආදරෙන් ළං වෙලා
සතුට දී මට එදා
සෙනෙහසින් සනසලා
ජීවිතය හැඩ කලා
නමුත් අද මේ ලෙසින්
මිලින වී යනු කිමද
හුදකලා වී ද ඔබෙ
ආදර ඒ හැගුම්
ජීවිතය ඉතිං නුඹ
නොවී නම් මගේ
නොනැගේවී හදවතේ
සෝ සුසුම් මේ තරම්..

**ප්‍රේමා රත්නායක**
ජර්මනිය

## දාන පාරමිතාව

දුගී දුප්පත්තු
මහ දන් දෙන
ලේ නැති මිනිස්සු
ලේ දන් දෙන
මරණින් පසු ඇස්ද
සිරුරුද දන් දෙන
විසාලා නුවරකි
තුන් බියම රැදුන.

එහි සිට අවුත්
තවිතිසා බවනට
ගත රුහිරු හා දැනුම
සුද්දන්ට පුද කොට
උපයන හැම දේත්
උන්ටම දන් දෙමි
දාන පාරමිතාව
සපුරා ලන්නට.

**ශ්‍රියානි පෙරේරා**
සවුත්බෑන්ක්

පසුවදන:අනේ මට මේ පිනෙන්
නිවන් සැප ලැබේවා සුද්දා
බුදුවන කල්පයේදීවත් !

# පහන් වැට

ඔබේ නිර්මාණ සෑම මසකම
15 දා ට පෙර එවන්න.

සංස්කරණය - තුෂාරී ප්‍රියංගිකා

කපුවාගේ පුරසාරම
පෝරුව මතදිම
මාරු වී ඇත
පාරුව දැන් පදින්නේ
වාරුව නැති කෙනෙකි
පූරුවේ පවකැයි සිතා
බාරියක් නොවුණාට
කාරියක් නැත කියා
සාරය උරා ගන්නට පෙර
සීරුවෙන්ම මාරු වී
යන්නටමයි හිත

**කමලිකා ගුණරත්න**



## ඇයි මේ වෙනස්කම්

ලොවි ගහට නැග ගන්න
හොඳවයින් ලොවි කන්න
දැන් ඉතිං බැරිලු මට
මා දැන් වැඩුණු කෙල්ලක්...

වැලි ගොඩේ දඟලන්න
මල්ලී සමඟ පොර කන්න
දැන් ඉතිං බැරිලු මට
මා දැන් වැඩුණු කෙල්ලක්...

මිතුරියන් සමඟින්න
කුඹුක් ළිඳෙන් නා ගන්න
දැන් ඉතිං බැරිලු මට
මා දැන් වැඩුණු කෙල්ලක්...

පාසලෙන් නවතින්න
ගෙදර වැඩ දැන ගන්න
සිදුවෙයිලු ළඟදි මට
නිසා මා ගැහැණියක්....

මා පියන් සනසන්න
නුපුරුදු දීගෙක යන්න
සිදුවෙයිලු ළඟදි මට
නිසා මා ගැහැණියක්....

සැමියාට කීකරුව
පතිවතත් රැකගන්න
බැරි උනොත් නිසැකයෙන්
සිදු වෙයිලු ගුටිකන්න
**ඇයි මේ වෙනස්කම්**
**නිසා මා ගැහැණියක්...**

**මල්ලිකා** - බර්ලින්

## සතුට

හීන්
දොළ පාර
අසළ
පුංචි කොළු
පැටියෙකි...
අතක
කෝටු
කැබැල්ලකි...

-tp-

## ගිම්හාන කඳුළ



බැණ අඬ ගසමින් වසන්ත උයනට
හම රැළි වී කෘශ වූ ගිම්හානය
පිපාසයට දිය පොදක් පතා ගෙන
හැරමිටි සරණින් ගාටයි උයනට

අඹ දඹ රඹ ඇ ලඹ දෙන උයනේ
නිල්ලෙන් ගිනි ගත් නෙතෙ යළි පිරුණේ
දොර ඇරපන් බං මගෙ රන් පුතුනේ
එනමුදු ගල් හද දොර නැත ඇරුණේ

අනේ කාලේ කියා තුරු අත් කම්මුලෙ තැබුවේ
බලා වටපිට නමා අත්තක් ඇයට පිරි නැමුවේ
ගම් ද නොගනිම්දෝ සීත කඳුළක් නෙතට ඉනුවේ
සත්මහල් යෝධයා ඇය දෙස පිළිකුලින් බැලුවේ

**ගැමුණු පී. දසනායක**

## ජාත්‍යාලය.....!

අරුම දෙයකි...
සිය රටේදී
සැඟවෙනා..
පිටරටකදී
මතුවෙනා......!

**වර්ණා රසිකා ඒකනායක**

## Death

Life is not sweet though full of pain and rapture
It's the sweetest minus suffering and pleasure,
You will not hear birds singing and leaves falling
Nor see blossomed flowers and bees humming
You don't see changing seasons and fading flowers
As you become enwrapped by darkness.

You have left an impermanent world
Where there is nothing permanent and solid.

Death brings peace you longed for
And eternal peace you cried for.

**Mathu Liyanage**
(South Australia)

## කරදාසි මල්

කවුළුවට මුවාවී
ඇති රෝස මල් ගසක
කැකුළු ඇරෙනා කලට
සුවඳ පාවී අවුත්
හැපෙන්නේ කවුළුවේ
සීරුවට වසාලූ
අගුල මත.

මගේ මේසය කොනේ
මල් බඳුන පුරාගෙන
නුඹ ගෙනා රෝස මල්
නෙක පැහැති රෝස මල්
පරනොවෙන නොමපිපෙන
කරදාසි රෝස මල්..
කවුළුවෙන් එහා ඉඳ
මා සොයා ඇදී එන
මුදු සුවඳ නොදේ මට
කිසිදාක.

**චන්ද්‍රිකා ද සිල්වා**

## තනිකම මැකුවෙ ඔබයි

පුරවමි පත් තීරුව මගෙ තනිකමට
හොඳ කවි පද ගැලුවා මගෙ තනි හිතට
ලීවෙමි අදහස් මම සීරුවට
දෙන්නෙමි පත් තිරුව මම අද සන්නසට

තනිකම හුරුයි දැන් මට මේ ලෙසට
බැලුවෙමි පත්තර සඟරා එක දිගට
යැව්වා මගේ කවි නිසඳැස් ඔබ අතට
තනිකම මැකෙයි දැන් මගෙ මේ ලෙසට

බාරයි කවිය ඔබ හට කියවන්න
සන්නස අදම වෙන් කරවා ගන්න
පළවුණු විටදි මගෙ කවියත් ඔන්න
ලැබුවා දිරිය තව පත් ඉරු පුරවන්න

**සිදා මාටින්ස්ටයින්**

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.